# ආරක්ෂක අමාත්‍යංශය

**ලංසු කැඳවීම**

## හෘද සහ උරස් සංකටක දැඩි සත්කාරක වාට්ටු සංකීර්ණය ඉදිකිරීම
## රිජ්වේ ආර්‍යා ළමා රෝහළ කොළඹ - 08
## (වායු සමීකරණ පද්ධතිය සැපයීම සහ ස්ථාපනය)

**කොන්ත්‍රාත් අංකය** : SB/G/179/53/2020

1. **රිජ්වේ ආර්යා ළමා රෝහලේ හෘද සහ උරස් සංකටක සත්කාර සංකීර්ණයේ වායු සමීකරණ පද්ධතිය සැපයීම සහ ස්ථාපනය** සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන් තෝරා ගැනීම සඳහා අංක 15/5,බාලදක්ෂ මාවත කොළඹ 03 හි ආරක්ෂක අමාත්‍යාංශයේ කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටු සභාපතිතුමා වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයා විසින් මුද්‍රා තබන ලද ලංසු සඳහා ආරාධනා නිකුත් කෙරේ. ඇස්තමේන්තුගත මුදල **රුපියල් මිලියන දෙසිය අසූ හයකි (**අවිනිශ්චිතතා සහ බදු හැර). නිමකිරීමේ කාලය ලිත් දින 182 කි. ඉදිකිරීම් පරිශ්‍රය කොළඹ 08, රිජ්වේ ආර්යා ළමා රෝහල පරිශ්‍රයේ පිහිටා ඇත.

2. ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියා පටිපාටියට (NCB) අනුව ලංසු තැබීම සිදු කරනු ලැබේ.

3. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලබන ලංසුකරුවන් අසාදු ලේඛන ගත කර නොතිබිය යුතු අතර පහත සඳහන් සුදුසුකම් හා නිපුණතා නිර්ණායක සපුරාලිය යුතුය.

   අ) ලංසුකරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) **කාර්මික වාතනය සහ වායු සමීකරණ කටයුතු සම්බන්ධයෙන් (MVAC) EM -1** ශ්‍රේණිය සඳහා ලියාපදිංචි වී තිබිය යුතුයි.

   ආ) පසුගිය වසර පහ තුළ සිදු කරන ලද ඉදිකිරීම් කටයුතුවල සාමාන්‍ය වාර්ෂික පරිමාව අවම වශයෙන් **රුපියල් මිලියන 450ක්** විය යුතුය.

   ඇ) තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ / හෝ ව්‍යාපෘති නිශ්චිත ණය පහසුකම් ප්‍රමාණය වෙනත් කොන්ත්‍රාත්තුමය බැඳීම් හා මෙම කොන්ත්‍රාත්තුව යටතේ කරනු ලබන යම් අත්තිකාරම් ගෙවීම් හැර **රුපියල් මිලියන 143.3 ට** විය යුතුය.

ඈ) පසුගිය වසර පහ තුළ ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලෙස සමාන ස්වභාවයකින් හා සංකීර්ණත්වයකින් යුතු ගොඩනැගිලි ව්‍යාපෘතියක් ඉදිකිරීමේ පළපුරුද්ද.

ඉ ) පහත සඳහන් කාර්යය මණ්ඩලය ද කොන්ත්‍රාත්කරු සතු විය යුතුය.

- යාන්ත්‍රික ඉංජිනේරු (වැඩබිම - අර්ධකාලීන) - විද්‍යාවේදී යාන්ත්‍රික ඉංජිනේරු උපාධිය හෝ ඊට සමාන සුදුසුකමක් සපුරා තිබීම සහ වසර 2ක පළපුරුද්ද

- සහයක යාන්ත්‍රික ඉංජිනේරු (වැඩබිම - පූර්ණ කාලීන) - ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) / උසස් ජාතික ඩිප්ලෝමාව (HND) / පූර්ණ කාලීන සැලසුම් ශිල්පය පිළිබඳ ජාතික සහතික පාඨමාලාව (NDES) හෝ ඊට සමාන සුදුසුකමක් සපුරා තිබීම සහ වසර 3ක පළපුරුද්ද.

5. අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංග සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් 2021/02/22 දින සිට 2021/03/14 දින දක්වා වැඩකරන දිනයන්හි **පැය 0900 -පැය 1500** දක්වා අතරතුර ප්‍රධාන මූල්‍ය නිලධාරී කායීාලය (බිම්මහල), ආරක්ෂක අමාත්‍යාංශය, අංක 15/5,බාලදක්ෂ මාවත,කොළඹ 03හිදී ලිඛිත අයදුම්පත්‍රයක් සහ ආපසු නොගෙවන රුපියල් 35,000.00ක (බදු රහිත) ගාස්තුවක් ගෙවීමෙන් මිල දී ගත හැකිය. මුදල් ගෙවීම මුදලින්ම කල යුතුවේ.

6. ලංසුකරුවන්ට අවශ්‍ය වැඩිදුර තොරතුරු පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකි අතර සහ ලංසු කැඳවීමේ අදාළ ලේඛන ප්‍රධාන මූල්‍ය නිලධාරි කාර්යාලය (බිම් මහල), ආරක්ෂක අමාත්‍යාංශය, අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 3 යන ලිපිනයෙන් **2021/02/22 සිට 2021/03/14** දක්වා ඕනෑම වැඩ කරන දිනයක **පැය 0900 සිට පැය 1500** දක්වා මුදල් ගෙවීමකින් තොරව ලබාගත හැකිය.

අධ්‍යක්ෂක ජෙනරාල් ඉංජිනේරු,
නාවික හමුදා මූලස්ථානය ,
ධජ වීදිය,
කොළඹ 01,

දුරකථන අංක – 0117194211
ෆැක්ස් – 011 2441456
විද්‍යුත් තැපෑල - nhqdge@gmail.com

ලංසු **2021/07/12** දින දක්වා (ලංසු අවසන් වන දින සිට දින 119ක්) වලංගු විය යුතුය.

7. ලංසු ඇපකරය, **රුපියල් 4,300,000.00** වටිනා ශ්‍රී ලංකාවේ මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් අනුමත ආකෘතියෙන් යුක්ත එකක් වියයුතුය.

8. අදාල ලංසු ඇපකරය, ලංසු අවසාන වන දිනයේ සිට **2021/08/07** දින දක්වා (දින 147ක්) වලංගු විය යුතුය.

9. මේ සම්බන්ධව පෙර ලංසු හමුවක් **2021/03/09** වන දින **පැය 1000ට** කොළඹ 08 රිජ්වේ ආර්යා ළමා රෝහලේ දී පැවැත්වේ.

10. ලංසු මුල් පිටපත හා දෘඩ පිටපත (Hard Copy) එකකින් (01) ඉංග්‍රිසි බසින් සම්පුර්ණ කර ලංසු භාරගන්නා අවසාන වේලාව වන **2021/03/15** වන දින **1400 පැයට** හෝ ඉන් පෙර කොලඹ 03, බාලදක්ෂ මාවතේ, නො.15/05,ආරක්ෂක අමාත්‍යාංශයේ කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලැබෙන සේ අතින් ගෙනවිත් භාරදිම හෝ ලියාපදිංචි තැපෑලෙන් එවිම හෝ කල යුතුය. ලංසු ඇසුරුම් වල පිටත ලිපි කවරයේ ප්‍රසම්පාදනයේ යොමු අංක පැහැදිලිව සටහන් කල යුතුය.

11. නියමිත දිනට නොලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම ලංසු කැඳවීම අවසන් වූ වහාම 2021/03/11 දින පැය 1400ට පැමිණීමට බලාපොරොත්තු වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් සිදු කරනු ලැබේ. ලංසුකරු හැර ඔහුගේ නියෝජිතයකු සහභාගි වන්නේනම් ලංසුකරුගේ අනුමැතිය ලත් ලිපියක් ඉදිරිපත් කළ යුතුය.ලංසුකරු විසින් ටෙන්ඩර් විවෘත කිරීමට අවම වශයෙන් වැඩ කරන දින තුනකට පෙර ටෙන්ඩර් විවෘත කිරීම සඳහා සහභාගිවන පුද්ගලයාගේ නම් සහ ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරියා වෙත ලිඛිතව දැනුම් දෙන ලෙස ද ලංසුකරුට උපදෙස් දෙනු ලැබේ.

12. නිසි පරිදි සම්පුර්ණ නොකරන ලද මිල ගණන් පත්‍රිකා හා ලිඛිත සාක්ෂි අවශ්‍ය පරිදි ඉදිරිපත් නොකරන ලද, ටෙන්ඩර් පත්‍රිකා ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම මිල ගණන් පතක් පිලිගැනිම හෝ ප්‍රතික්ෂේප කිරිමේ බලය සභාපති, කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) සතු වේ.

13. මෙම පුවත්පත් දැන්විම ශ්‍රි ලංකා නාවික හමුදා වේබ් අඩවිය www.navy.lk සහ ආරක්ෂක අමාත්‍යාංශ වෙබ් අඩවිය www.defence.lk මගින්ද නිරික්ෂණය කල හැක.

**සභාපති,**
**අමාත්‍යාංශ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රධාන මූල්‍ය නිලධාරි කාර්යාලය (බිම් මහල),**

**ආරක්ෂක අමාත්‍යාංශය,**
**අංක 15/5,**
**බාලදක්ෂ මාවත,**
**කොළඹ 03.**